රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 27/2008 (I)

මගේ අංකය : EST/7/LEAVE/03/3490
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ - 07.

2013.05.23

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>ගුරුවරුන් ඇතුළු රාජ්‍ය සේවාවේ ස්ථිර කරනු ලැබූ පූජක පැවිදි අය සඳහා ආයතන සංග්‍රහය යටතේ නිවාඩු අනුමත කිරීම.</u>**

2008.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/2008 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඉහත චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 16:1:7 උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත උප වගන්තිය ආදේශ කෙරේ.

16:1:7 රාජ්‍ය සේවයෙහි නිරත, තනතුරෙහි ස්ථිර කරන ලද සියළුම ආගම් හි පූජ්‍ය / පූජක උතුමන්ට විදේශ රටවල ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරතවීම සඳහා සහ දේශීය වශයෙන් ආගමික සේවාවන් කිරීම සඳහා අවුරුදු දෙකක (02) උපරිමයකට යටත්ව වැටුප් රහිත නිවාඩු ලබාදිය හැක. එලෙස නිවාඩු ලබාදීම නිර්දේශ / අනුමත කිරීමේදී ආයතනයේ සාමාන්‍ය සේවාවන් නිසි පරිදි පවත්වාගෙන යාමට බාධාවක් නොමැති බවට අදාළ ආයතන ප්‍රධානීන් සහතික විය යුතුය.

03. මෙම විධිවිධාන 2013.02.14 දින සිට ක්‍රියාත්මක වන අතර, චක්‍රලේඛයේ අනෙකුත් විධිවිධාන නොවෙනස්ව පවතී.

පි. බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය